*සැ. යු.*– 2007.03.30 දින පළවූ අංක 1,491 දරණ *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,492 - 2007 අප්‍රේල් 05 වැනි බ්‍රහස්පතින්දා - 2007.04.05**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | – | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 282 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 278 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 283 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අප්‍රේල් මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 මාර්තු මස 30 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - කඩුවෙල

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ රාජසන්තක වූ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොකියන ලද පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් 2007.04.21 දින පෙ. ව. 10.00 ට කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් පහත ද්‍රව්‍යයන් පිළිබඳ හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින, වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරිය වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුයි.

03. රෙජිස්ට්‍රාර් වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂාකර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා ද්‍රව්‍යයන් සඳහා එදිනම මුදල් ගෙවා පස්වරු 4.00 ට එම භාණ්ඩ අධිකරණයෙන් ඉවත් කරගෙන යා යුතුය.

06. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ. වෙන්දේසියට සහභාගිවීම සඳහා පැමිණෙන්නන් සිය ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

ඒ. ඒ. සී. ජේ. රාජරත්න,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය - කඩුවෙල.

2007 මාර්තු මස 14 වැනි දින,
කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසි කිරීමට ඇති භාණ්ඩ ලැයිස්තුව

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | 37870 | ගෑස් සිලින්ඩර | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 2. | 55385 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් (වට 04) | 01 |
| | | අත් පොම්ප | 01 |
| 3. | 5128 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| 4. | බී. 2655 | යකඩ කැබලි | 18 |
| 5. | 2434 | යකඩ උර | 01 |
| 6. | 1687 | දුරකථන කම්බි තොගය | |
| 7. | 46274 | කම්බිකූරු | 23 |
| 8. | බී. 5157 | ඩීසල් අඩංගු කෑන් | 05 |
| 9. | ඒ. ආර්. 7701 | බ්ලෙන්ඩර් | 01 |
| 10. | ඒ. ආර්. 7702 | රෙදි කපන විදුලි කටර් | 01 |
| 11. | ඒ. ආර්. 7381 | ටෝස්ටර් | 01 |
| 12. | ඒ. ආර්. 7886 | සි. ඩී. කැසට් ප්ලේයර් | 01 |
| 13. | ඒ. ආර්. 7888 | බ්ලෝවර් | 01 |
| 14. | ඒ. ආර්. 7887 | ග්‍රයින්ඩර් | 01 |
| 15. | 65802 | අඩි 08 අහල් 6 දිග වයර් | 01 |
| | | අඩි 05ක් දිග වයර් | 01 |
| | | අඩි 04ක් දිග වයර් | 01 |
| 16. | 1566 | ට්‍රිප් ස්වීච් | 01 |
| 17. | ඒ. ආර්. 7892 | ජංගම දුරකථන | 01 |
| 18. | ඒ. ආර්. 7885 | ජංගම දුරකථන | 01 |
| 19. | ඒ. ආර්. 7884 | ජංගම දුරකථන | 01 |
| 20. | 41353 | පිත්තල මල්වාස් | 01 |
| 21. | 1862 | ස්පැනර් | 01 |
| 22. | ඒ. ආර්. 7889 | පාපැදිය | 01 |
| 23. | ඒ. ආර්. 7888 ඒ | පා පැදිය | 01 |
| 24. | බී. 2890 | උළුවහු ප්‍රේම් | 04 |
| 25. | හිස් වීදුරු බෝතල් තොගයක් | | |
| 26. | හිස් කෑන් තොගයක් | | |
| 27. | උදලු තොගයක් (නඩු කිහිපයකට අයත්) | | |
| 28. | සවල් කිහිපයක් (නඩු කිහිපයකට අයත්) | | |
| 29. | ඒ. ආර්. 6427 | කාර් රථය (කොටස් ලෙස විකිණීම) 8 ශ්‍රී 9325 | 01 |
| 30. | ඒ. ආර්. 7890 | 103-5162 යතුරු පැදිය | 01 |
| 31. | ඒ. ආර්. 7891 | 108-6236 යතුරුපැදිය | 01 |
| 32. | 34712 | 16-2791 වෑසිය (ත්‍රීවිල් රථය) | 01 |
| 33. | එන්. එස්. 16 | චැසි අංකය හා එන්ජින් අංකය මකාදමා ඇති ට්‍රේල් වර්ගයේ යතුරුපැදිය | |
| 34. | ඒ. ආර්. 887 | අංක 200-3435 ත්‍රීවිල් රථය | |
| 35. | 1153 | රන් දම්වැල් | 01 |
| 36. | එන්. එස්. 85 | රන් මාල කැබලි | 02 |
| | | පෙන්ඩන්ට් | 01 |
| 37. | 44694 | රන් වළලු | 01 |
| | | රන් මුදු | 01 |
| | | කැරලි රන් දම්වැල් | 01 |
| | | රතුපාට ගලක් අල්ලන ලද කාන්තා රන් මුදු | 01 |
| | | කැටයම් කරන ලද පිරිමි රන් මුදු | 01 |
| | | කාන්තා අතු මුදු | 01 |
| | | කැටයම් කරන ලද මුදු | 01 |
| | | මලක හැඩයේ පෙන්ඩන්ට් | 01 |
| | | කුඩා කරාබු ජෝඩු | 01 |
| 38. | 1154 | පිරිමි මුදු | 01 |
| | | කාන්තා මුදු | 01 |
| 39. | ඒ. ආර්. 7698 | රන් කැබැල්ල | 01 |
| 40. | ඒ. ආර්.7699 | රන් දම්වැල් | 01 |
| | | රන් දම්වැල් | 01 |
| | | රන් අත්පළඳනා | 01 |
| | | කාන්තා මුදු | 01 |
| 41. | ඒ. ආර්. 7700 | රන් වළල්ලක් | 01 |
| 42. | 27436 | රන් දම්වැල් | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|
| | | කාන්තා බැරල් මුදු | 01 |
| 43. | ඒ. ආර්. 6572 | නිල්පාට ගලක් අල්ලන ලද මුදුවක් | |
| | | රන්මුදු | 01 |
| 44. | 446/97 | රන් ආලේපිත ගැහැණු බැරල් මුදු | 01 |
| | | රන් ආලේපිත ගැහැණු බැරල් මුදු | 01 |
| 45. | 48011 | රන් ආලේපිත අත් පළඳනා | 01 |
| 46. | 6002 | ඉමිටේෂන් භාණ්ඩ | |
| 47. | 27436 | මැණික් ගල් යැයි හඳුන්වනු ලබන ගල් කිහිපයක්. | |

04-156

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - මල්ලාකම්

### උසාවියට ඉදිරිපත් කරන ලද භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2007.03.10 වැනි දින පෙ. ව. 10.00 ට මල්ලාකම් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

02. රෙජිස්ට්‍රාර්වරයා ගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකිය.

03. අධිකරණය විසින් කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් පරීක්ෂා කළ බැලිය හැකිය.

04. වෙන්දේසියේ දී මිළ දී ගනු ලබන ද්‍රව්‍යයන් එම අවස්ථාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

සියලුම හිමිකම් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

05. ජාතික හැඳුනුම්පත් රැගෙන භාණ්ඩ ඉල්ලීමට පැමිණිය යුතු බව විශේෂයෙන් දැනුම් දෙමි.

එස්. ඉලංගෝවන් මහත්මිය,<br>
මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
මල්ලාකම්.

2007 ජනවාරි මස 10 වැනි දින,

මල්ලාකම් මහෙස්ත්‍රාත් අධිකරණයේ වෙන්දේසි කරනු ලබන භාණ්ඩ පිළිබඳව විස්තර මෙසේ ය.

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය | වර්ගය | අංකය | තීන්දු දිනය |
|---|---|---|---|---|---|
| 01. | ඒආර් 485/05 | පාපැදිය | ඒෂියා | 03 සී 3036 | 29.11.2005 |
| 02. | 5215 | පාපැදිය | ලුමාලා | 55741162 | 19.06.2006 |
| 03. | ඒආර් 364/04 | පාපැදිය | ලුමාලා | ඒ 41208 | 24.11.2006 |
| 04. | ඒආර් 364/04 | පාපැදිය | ලුමාලා | 55517894 | 24.11.2006 |
| 05. | ඒආර් 364/04 | පාපැදිය | ඊස්ටන් | 01 ඊආර් 2936 | 24.11.2006 |
| 06. | ඒආර් 364/04 | පාපැදිය | ලුමාලා | 11119955 | 24.11.2006 |
| 07. | ඒආර් 364/04 | පාපැදිය | ලුමාලා | එස්ආර්එස්ඕ 2247 | 24.11.2006 |
| 08. | ඒආර් 364/04 | පාපැදිය | ලුමාලා | ඒ සී 1878 | 24.11.2006 |
| 09. | ඒආර් 364/04 | පාපැදිය | ලුමාලා | එන් එම් 0835 | 24.11.2006 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය | වර්ගය | අංකය | තීන්දු දිනය |
|---|---|---|---|---|---|
| 10. | ඒආර් 364/04 | පාපැදිය | ලුමාලා | 55924949 | 24.11.2006 |
| 11. | ඒආර් 364/04 | පාපැදිය | ඒෂියා | 0607895 | 24.11.2006 |
| 12. | ඒආර් 134/06 | පාපැදිය | ලුමාලා | 55559837 | 19.04.2006 |
| 13. | ඒආර්283/04 | පාපැදිය | ලුමාලා | එක්ස් 129924 | 01.03.2005 |
| 14. | ඒආර්314/04 | පාපැදිය | රැලේ | එච් ඕ 2889 | 05.10.2004 |
| 15. | ඒආර් 162/03 | පාපැදිය | ලුමාලා | 56107877 | 27.05.2003 |
| 16. | 1798 | පාපැදිය | ලුමාලා | 55740482 | 20.09.2005 |
| 17. | ඒආර් 119/00 | පාපැදිය | ලුමාලා | ඒ 25218 | 14.07.2000 |
| 18. | ඒආර් 32/01 | පාපැදිය | ඒෂියන් | 0600930 | 23.07.2004 |
| 19. | ඒආර් 183/05 | පාපැදිය | ලුමාලා | - | 20.09.2005 |
| 20. | ඒආර් 70/05 | පාපැදිය | ලුමාලා | 55780553 | 18.02.2005 |
| 21. | ඒආර් 70/05 | පාපැදිය | නැත | ඒ සී 1387 | 18.02.2005 |
| 22. | ඒආර් පාපැදිය | පාපැදිය | පැහැදිලි නැත | 002 ඒ සී 7406 | 18.02.2005 |
| 23. | ඒආර් | පාපැදිය | ලුමාලා | 12285723 | 18.02.2005 |
| 24. | ඒආර් 372/04 | ගල | - | - | 30.11.2004 |
| 25. | 7508 | ගල් විදින යන්ත්‍රය | තිරානියස් | 101789 | 10.03.2005 |
| 26. | 7760 | සෙල්පෝන් | නොකියා | 1100සීඑන් 168 | 06.05.2005 |
| 27. | 7266 | (i) ටෝච් | - | - | 28.01.2005 |
| | | (ii) පොරව | - | - | - |
| | | (iii) පිහිය | - | - | - |
| 28. | ඒආර් 60/01 | රූපවාහිනී පෙට්ටි | - | - | 08.02.2001 |
| 29. | ඒආර් 10/04 | විදුලි පංකාව | - | - | 21.06.2004 |
| 30. | 5128 | පිහියා 02 | - | - | 13.10.2003 |
| 31. | ඒආර් 96/01 | රූපවාහිනි පෙට්ටි | නැෂනල් | ඒ. 031115 | 13.03.2001 |
| 32. | ඒආර් 119/00 | රේඩියෝව | - | - | |
| | | පොරව 1 | - | - | 14.07.2000 |

04-23

---

## සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - දෙහිඅත්තකණ්ඩිය

දෙහිඅත්තකණ්ඩිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2007 අප්‍රේල් මස 28 වැනි දින පෙ. ව. 10.00 ට දෙහිඅත්තකණ්ඩිය අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකුවේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාල භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අඩුම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේ දී හා මුදල් ගෙවීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කල යුතු අතර, භාණ්ඩ මිලදී ගැනීමට එන සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ගෙන ඒම අනිවාර්ය වේ.

06. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේදී ම ප. ව. 6.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

ඩී. ඒ. ආර්. පතිරණ,
මහෙස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය, මහියංගණය.

2007 මාර්තු මස 14 වැනි දින,
මහියංගණය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | |
|---|---|---|---|
| 01. | 20708 | 22 ශ්‍රී 7850 මැසිපර්ගියුසන් ට්‍රැක්ටර් රථය (ට්‍රේලරය සමග) | |
| 02. | 21749 | 78-4918 දරන අත් ට්‍රැක්ටරය (ට්‍රේලරය සමග) | |
| 03. | ඒආර්/67/05 | චැසි අංක ඒ 006-1301948 දරන එන්ජින් අංක ඒ ඩී 06 එෆ් - 1301941 යතුරු පැදිය | |
| 04. | 26340 | එන්සීඑච්ජී 6301 දරණ ඩයිඩෝ වර්ගයේ යතුරු පැදිය | |
| 05. | 36655 | 123-2004 දරන හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය | |
| 06. | 26342 | 115-7123 දරන හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය | |
| 07. | 17796 | 89 ශ්‍රී 7471 දරන හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය | |
| 08. | 43035 | ටී. පී. එච්. එක්ස්. 3605 දරන ඩයිඩෝ වර්ගයේ යතුරු පැදිය | |
| 09. | 11802 | 116-3722 දරන හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය | |
| 10. | ඒආර්/720/04 | 138-1218 දරන හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය | |
| 11. | 23060 | 119-8814 දරන සුසුකි වර්ගයේ යතුරුපැදිය | |
| 12. | ඒආර්/3435/01 | 116-9009 දරන සුසුකි වර්ගයේ යතුරුපැදිය | |
| 13. | ඒආර්/653/06 | පාපැදි | 01 |
| 14. | ඒආර්/912/08 | පාපැදි | 01 |
| 15. | 15302 | පාපැදි | 01 |
| 16. | ඒආර් 338/05 | පාපැදි | 02 |
| 17. | ඒආර්/717/02 | පාපැදි | 01 |
| 18. | ඒආර්/952/02 | පාපැදි | 01 |
| 19. | 15111 | පාපැදි | 01 |
| 20. | 38866 | පාපැදි | 01 |
| 21. | 8073 | පාපැදි | 01 |
| 22. | 6537 | පාපැදි | 01 |
| 23. | 35551 | පාපැදි | 01 |
| 24. | ඒආර්/858/03 | පාපැදි | 01 |
| 25. | ඒආර්/263/03 | පාපැදි | 02 |
| 26. | ඒආර්/1671/04 | පාපැදි | 01 |
| 27. | ඒආර්/1850/04 | පාපැදි | 01 |
| 28. | ඒආර්/1849/04 | පාපැදි | 01 |
| 29. | ඒආර්/1447/05 | පාපැදි | 01 |
| 30. | ඒආර්/43/05 | පාපැදි | 01 |
| 31. | ඒආර්/808/05 | පාපැදි | 01 |
| 32. | ඒආර්/809/05 | පාපැදි | 01 |
| 33. | 28121 | පාපැදි | 01 |
| 34. | අංක රහිත | අබලන් පාපැදි | 01 |
| 35. | 29372 | ඉලෙක්ට්‍රික් බහුකාර්ය වඩු මැෂින් | 01 |
| 36. | 32967 | ඉලෙක්ට්‍රික් තරාදි | 01 |
| 37. | 32968 | ඉලෙක්ට්‍රික් තරාදි | 01 |
| 38. | 32969 | ඉලෙක්ට්‍රික් තරාදි | 01 |
| 39. | බී/367/05 | සී 200 මෝටරෝලා ජංගම දුරකථනය | 01 |
| | | ඩී සී 526 ඩිජිටල් කැමරාව (කැමරා චාජරය සමග) | |
| 40. | අංක රහිත | අබලන් කරත්ත | 02 |
| 41. | ඒආර්/17/ඒ | හීටර් ප්ලග් | 01 |
| | | චාජර් ලයිට් | 01 |
| 42. | 13437 | ඉල්ලම්කුරු | 01 |
| 43. | අංක රහිත | ඇඳුම් උදලු තල | 03 |
| 44. | 13773 | කරත්ත | 01 |
| 45. | 13774 | කරත්ත | 01 |
| 46. | අංක රහිත | කරත්ත | 02 |
| 47. | අංක රහිත | කරත්ත | 01 |
| 48. | අංක රහිත | කරත්ත | 01 |
| 49. | අංක රහිත | කරත්ත | 01 |
| 50. | අංක රහිත | කරත්ත | 01 |
| 51. | අංක රහිත | උඩයට ඉරන කියත් 03, පොරෝව 01, කැති | 02 |
| 52. | අංක රහිත | උඩයට ඉරන කියත්, පොරෝ 02, කැති 01 | |
| 53. | අංක රහිත | උඩයට ඉරන කියත් 03, පොරෝ 01, කැති 02 | |
| 54. | අංක රහිත | උඩයට ඉරන කියත් 03, පොරෝ 02, කැති 01 | |
| 55. | අංක රහිත | උඩයට ඉරන කියත් 03, පොරෝ 01, කැති 02 | |
| 56. | අංක රහිත | උඩයට ඉරන කියත් 02, පොරෝ 02, කැති 01 | |
| 57. | අංක රහිත | උඩයට ඉරන කියත් 02, පොරෝ 01, කැති 01 | |
| 58. | අංක රහිත | උඩයට ඉරන කියත් 01, කැති 01 | |
| 59. | අංක රහිත | හරස් කියත් 02 | |
| 60. | අංක රහිත | හරස් කියත් 01 | |
| 61. | අංක රහිත | හරස් කියත් 02 | |
| 62. | අංක රහිත | හරස් කියත් 01 | |
| 63. | අංක රහිත | දුනු තරාදි 03, තට්ටු තරාදි 04, කරඩි 01 | |
| 64. | අංක රහිත | දුනු තරාදි 04, තට්ටු තරාදි 05, කරඩි 01 | |
| 65. | අංක රහිත | දුනු තරාදි 02, තට්ටු තරාදි 05, කරඩි 01 | |
| 66. | අංක රහිත | දුනු තරාදි 01, තට්ටු තරාදි 04, කරඩි 01 | |
| 67. | අංක රහිත | දුනු තරාදි 02, තට්ටු තරාදි 06, කරඩි 01 | |
| 68. | අංක රහිත | දුනු තරාදි 02, තට්ටු තරාදි 05, කරඩි 01 | |
| 69. | අංක රහිත | දුනු තරාදි 01, තට්ටු තරාදි 03, කරඩි 01 | |
| 70. | අංක රහිත | දුනු තරාදි 01, තට්ටු තරාදි 02, කරඩි 01 | |
| 71. | අංක රහිත | බිම් තරාදි 01 | |
| 72. | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි 01 | |
| 73. | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි 02 | |
| 74. | අංක රහිත | ඇලුමිනියම් මුට්ටි 01 | |
| 75. | අංක රහිත | සවල් 05 | |
| 76. | අංක රහිත | සවල් 04 | |
| 77. | අංක රහිත | සවල් 02 | |
| 78. | අංක රහිත | සවල් 03 | |
| 79. | අංක රහිත | සවල් 04 | |
| 80. | අංක රහිත | සවල් 02 | |
| 81. | අංක රහිත | වයර් කැබලි කි. ග්‍රෑම් 03 | |
| 82. | අංක රහිත | වයර් කැබලි කි. ග්‍රෑම් 05 | |
| 83. | අංක රහිත | වයර් කැබලි කි. ග්‍රෑම් 04 | |
| 84. | අංක රහිත | වයර් කැබලි කි. ග්‍රෑම් 02 | |
| 85. | අංක රහිත | වයර් කැබලි කි. ග්‍රෑම් 03 | |
| 86. | අංක රහිත | වයර් කැබලි කි. ග්‍රෑම් 04 | |
| 87. | අංක රහිත | වයර් කැබලි කි. ග්‍රෑම් 02 | |
| 88. | අංක රහිත | තඹ කැබලි තොගයක් | |
| 89. | අංක රහිත | බෝතල් තොගයක් | |
| 90. | අංක රහිත | බොක්ස් ගිටාර් - 02 | |
| 91. | 20490 | 01. තේක්ක වර්ගයේ කෑම මේස 01යි | |
| | | 02. බුරුත කෑම මේස පුටු 06යි | |
| | | 03. බුරුත වර්ගයේ ආලින්ද පුටු 06යි | |
| | | 04. බුරුත වර්ගයේ ස්ටූල් 01යි | |
| | | 05. බුරුත වර්ගයේ ඇඳන් 01යි | |

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනීසිටීමට පෙර කරනු ලබන දැන්වීම

මිරීලා කුමාරි රත්නායක වන මා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති හෙයින් ගාල්ල දිස්ත්‍රික් මහාධිකරණ කලාපයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ලෙස ඇතුලත් වීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉහත පරීක්ෂණයට පෙනී සිටීමට අවසර ඉල්ලා සිටීමට අදහස් කරන අතර එයට අදාල මේ සමඟ අමුණා ඇති දැන්වීම දිසා අධිකරණයේ දැන්වීම් පුවරුවේ පළ කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට,
විශ්වාසී,
මිරීලා කුමාරි රත්නායක.

04-102

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මීට කලින් එක්සත් රාජධානියේ එම්කේ 7 එච්ජ් වොල්ටන් කයින්ස් අංක 3, සීග්‍රෝව් කෝට් යන ලිපිනයේ පදිංචිව සිට දැනට එක්සත් රාජධානියේ 9 බීයූ, එම්කේ 10, මිල්ටන් කයින්ස් මොන්ක්ස්ටන් බ්‍රිඩ්ලිංටන් ක්‍රෙසන්ට් හි අංක 7 දරන ස්ථානයේ පදිංචි සීක්කු බදුගේ දුලිත් කසුන් ද සිල්වා වන මා විසින් ෆ්‍රැන්ක් ලිං සොලිසිටර්ස් එල්. එල්. පී. යන ආයතනය මගින් සහතික කරන ලද සීක්කු බදුගේ දසුන්මි නමල්කා ද සිල්වාට ප්‍රදානය කරන්නට යෙදුණු වර්ෂ 2005ක් වූ අප්‍රේල් මස 12 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලය මා විසින් වර්ෂ 2007 ක් වූ මාර්තු මස 26 වැනි දින සිට අවලංගු කොට අහෝසි කළ බවත්, මින් මතු එකී සීක්කු බදුගේ දසුන්මි නමල්කා ද සිල්වා විසින් මාගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බවත් මෙයින් මහජනතාවට නිවේදනය කර සිටිමි.

සීක්කු බදුගේ දුලිත් කසුන් ද සිල්වා,

වර්ෂ 2007ක් වූ මාර්තු මස 26 වැනි දින දී ය.

04-98

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

පදියතලාව, අංක 143 හි පදිංචි අත්තනායක මුදියන්සේලාගේ සරත් කුමාර අත්තනායක වන මම, අම්පාර දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 වන අධිකාරය වන නොතාරිස් ආඥා පනතේ 07 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

ඒ. එම්. එස්. කේ. අත්තනායක,

2007 මාර්තු මස 23 වැනි දින,
අංක 143, පදියතලාව.

04-103

---

## ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජගිරිය-නාවල පාරේ, පාක් ලේන් හි, අංක 27/13 දරන ස්ථානයේ පදිංචි සුරේෂ් ජෝන් වෙත ප්‍රදානය කරන ලද හා 1992 පෙබරවාරි මස 20 වන දින එකී ශ්‍රී ලංකා ජනරජයේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයෙහි ලියාපදිංචි කරන ලද, ප්‍රසිද්ධ නොතාරිස් මයිකල් සේන් මැටිනි මහතා විසින් ලියා අත්සන් කරන ලද 1992 ජනවාරි මස 28 වන දින දරන ඇටොර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරනු ලබන බව සහ මින් ඉදිරියට එකී ඇටෝර්නි බලය යටතේ පවත්වනු ලබන කිසියම් ගණුදෙනුවක් මත අපේ කිසිදු වගකීමක් නොමැති බව, ඇමරිකා එක්සත් ජනපදයේ, ඔරිගන්, පෝට්ලන්ඩ්, 14375 එන්. ඩබ්ලිව්. සයන්ස් පාක් ඩ්‍රයිව් හි කොළම්බියා ස්පෝට්ස්වෙයාර් සමාගමේ උප සභාපති/ජෙනරල් කවුන්සල් සහ ලේකම් වන පීටර් ජේ. බිරුග්ඩන් වන මම, එකී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව හා ආණ්ඩුව වෙත මෙයින් දන්වා සිටිමි.

පීටර් ජේ. බිරුග්ඩන්,
උප සභාපති/ජෙනරල් කවුන්සල් හා ලේකම්,
කොළම්බියා ස්පෝට්ස්වෙයාර් සමාගම.

04-31

---

## ඇටර්නි බලය ප්‍රත්‍යා දිෂ්ඨ කිරීම

මහනුවර, ජෝර්ජ් ඊ. ද සිල්වා මාවතේ, අංක : 92 හි පදිංචිව සිට දැනට කැලිපෝර්නියාවේ ලෝන්ග් බීජ්, ක්ලාක් ඇවිනිව් හි, අංක 4238 පදිංචිව සිටින බටුගෙදර දාවිත්ලාගේ සමරවීර වන මා විසින්, මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. ඩී. දේසිංහ මහතාගේ වර්ෂ 2001.01.15 වැනි දින සහතික කරන ලද අංක 2679 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින්, මහනුවර, පේරාදෙනිය පාරේ, අංක 474 හි, පදිංචි කෝසල ජෙරාඩ් නිහාල් රංගල යන අයට මා වෙනුවෙන් කටයුතු කිරීමට බලය දෙන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යා දිෂ්ඨ කොට අවලංගු කරන ලද බව මහජනතාවට මෙයින් නිවේදනය කරන අතර ඉහත කී ඇටර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට පහත අත්සන් කරන අය වගකියනු නොලැබේ.

බටුගෙදර ඩී. සමරවීර.

04-32

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දිසා අධිකරණයේ දී ය.

නඩු අංකය 16482/එම්. බී.

කොළඹ 13, ජෝර්ජ් ආර් ද සිල්වා මාවතේ, අංක 198 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ ද, කොළඹ 01 බ්‍රිස්ටල් වීදියේ අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔප් සිලෝන් ලිමිටඩ්

පැමිණිලිකරු.......................

එදිරිව

කොළඹ 09, ආරාමය පාරේ සිලරත්න පටුමග අංක 30/17, සහ 30/20 දරන ස්ථානයේ මාරසිංහ මුදියන්සේලාගේ කලු බණ්ඩා මාරසිංහ

විත්තිකරු.........................

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ නියෝගය අනුව ඉහත කී විත්තිකරු විසින් පැමිණිලිකරුට රුපියල් නව ලක්ෂයක (රු. 900,000) මුදලක් සහ ඒ මත 1991.06.01 වන දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 26% ක බැගින් පොලිය සහ එම පොලිය මත 5% බැගින් පිරිවැටුම් බදු රු. 300,000 ක මුදලක් සහ ඒ මත 1991.06.01 වන දින සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 26% බැගින් පොලිය සහ එම පොලිය මත 5% බැගින් පිරිවැටුම් බදුද (අධිකරණයේ නිලධාරියකු විසින් නියමිත පරිදි තක්සේරු කරන ලද) නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

වර්ෂ 1998 ක් වූ දෙසැම්බර් මස 10 වන දින දරන කොළඹ දිසා අධිකරණ නඩු තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට ඉහත කී විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී වර්ෂ 2007 ක් වූ අප්‍රේල් මස 28 වන දින ප.ව. 3.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ කඳාන සුලු නගර සභා සීමාව ඇතුලත කඳාන පිහිටි කොළඹ පාරේ වරිපනම් අංක 113 දරන්නා වූ දවටගහවත්ත නැමැති ඉඩමෙන් වූ බලයලත් මිනින්දෝරු තැන්පත් එම්. ඩී. ජේ. පී. පෙරේරා විසින් සාදන ලද අංක 546 හා 1979.11.29 වන දින දරන සැලැස්මේ දැක්වෙන ඉඩමට මායිම් උතුරට: එම්. බී. ඇලෙක්සැන්ඩර් සහ ජුලියට් පෙරේරාගේ ඉඩම නැගෙනහිරට: ලෙනාඩ් ජයවර්ධනගේ ඉඩම, දකුණට: එම්. බී. පෙරේරාගේ ඉඩම සහ බස්නාහිරට: මහ පාර සහ එහි වපසරිය පර්චස් විසි හතරයි දශම පහයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 24.50) ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 150 /164 හි ලියාපදිංචි වී ඇත.

*ඉඩමට පිවිසීම.–* කොළඹ මීගමු ප්‍රධාන පාරේ කි. මී. 25 ක් පමණ ඉදිරියට යන විට කඳාන නගර සීමාව තුළ දකුණු පසට වන්නට වරිපනම් අංක 113 දරන ස්ථානයේ ඉඩම පිහිටා ඇති අතර මෙම ස්ථානයේ සිට කඳාන නගරයට දුර කි. මී. (3/4) පමණ වේ.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසි අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25%,
2. නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තු රු. 4,000.00,
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ ගාස්තු 2.5%,
5. රජයේ ගාස්තු,
6. ලිපිකරු සහ සෝෂක ගාස්තු රු. 2500.00.

ඉතිරි 75%ක මුදල දින 30 ක් ඇතුලතදී කොළඹ දිසා අධිකරණයේ තැන්පත් කළ යුතුය.

ඔප්පු පරීක්ෂා කිරීම සඳහා සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කේ. ආර්. මහවිතාන,
තක්සේරුකරු සහ වෙන්දේසිකරු,
අංක 156-1/13, අලුත්කඩේ වීදිය,
කොළඹ 12,
දුරකථන අංකය : 5681990.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
අංක 24, බ්‍රිස්ටල් වීදිය,
කොළඹ 01.
දුරකථන අංක : 2347719 - 2447167.
ෆැක්ස් අංකය : 2347717.

04-48

---

## ඩීඑෆ්සීසී බැංකුව
(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීම

### වටිනා දේපොළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අංක 1521 දරන ඇපකරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ පාතගම - දකුණ පිහිටි පරණගෙදරවත්ත *හෙවත්* මහගෙදරවත්ත ඉඩමේ ලොට් සී හි ලොට් ඒ සහ බී පරණගෙදරවත්ත *හෙවත්* මහගෙදරවත්ත ඉඩමේ ලොට් ඩී සහ ලොට් බී වල කොටස, පරණගෙදරවත්ත *හෙවත්* මහගෙදරවත්ත ඉඩමේ ලොට් ඊ හි කොටස සහ පරණ ගෙදරවත්ත *හෙවත්* මහගෙදරවත්ත ඉඩමේ ලොට් එෆ් වල ලොට් සී හි ලොට් 1 ලෙස හඳුන්වනු ලබන යාබද

බිම් කොටස්වල බලයලත් මිනින්දෝරු එස්. කේ. ජී. සිල්වා මහතා විසින් 2002.04.20 දාතමින් යුතු ව සහතික කරන ලද, ලොට් A යනුවෙන් නිරූපිත ගස්, ගොඩනැගිලි යනාදිය ඇතුළත් සියල්ල ඉඩමේ ප්‍රමාණය අක්. 0 රූඩ් 02 පර්. 12.96 සියලු ම වගාවන්, ගොඩනැගිලි ඇතුළු එහි පිහිටි සියල්ල.

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. එන්. ඒ. කුරේරා මහතා විසින් සහතික කරන ලද 2003 ජූලි 12 දිනැති අංක 1521 උකස්කරය ප්‍රකාර අනුරාධපුරයෙහි නාඹටුන්න පලිය ගුරුගේ චන්ද්‍රා රංජිත් සමරනායක විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදු ව ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපොළ ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2007 අප්‍රේල් මස 26 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. රු. 27,115 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඩී.එෆ්.සී.සී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංක : 011-2442442.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ, පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, උපදේශක,
තක්සේරුකරුවෝ සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24,
ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmanKandy@sltnet.lk

*නගර කාර්යාලය :*
අංක 290
හැව්ලොක් පාර,
කොළඹ 5
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය: 2588176
ඊමේල් : schokman@samera1892.com

04-150

---

## ඩීඑෆ්සීසී බැංකුව

(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීම

### වටිනා දේපොළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### අංක 155 දරන ඇපකරය යටතේ උකස් කරන ලද දේපොළ පිළිබඳ විස්තර

උතුරු මැද පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ පිටිගල් කෝරළෙයේ දකුණ කම්මල් පත්තුවේ උල්හිටියාවෙහි පිහිටි දන්ගහවත්ත තල්ගහවත්ත සහ මදන්ගහවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. ජී. ෂෙල්ටන් සමරතුංග විසින් 1987 ජූලි මස 16 දාතමින් සකසන ලද අංක 2048 පිඹුරු පතෙහි ලොට් අංක 2 ලෙස බෙදන ලද සහ විස්තර කර දක්වන ලද සියල්ල ඉඩමේ ප්‍රමාණය අක්. 0, රූඩ් 01, පර්චස් 6 සියලු ම වගාවන් ඇතුළු එහි පිහිටි සියල්ල කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී රණමුකාරච්චි මහතා විසින් සහතික කරන ලද 1994 මැයි 11 දිනැති අංක 155 උකස්කරය ප්‍රකාර වෙන්නප්පුව, උල්හිටියාව, දකුණු කඩවත පාර "රොසරි විලා" හි වර්ණකුලසූරිය ජෝන් ඇන්ස්ලම් ටයිටස් තිසේරා විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2007 අප්‍රේල් මස 24 වැනි දින (අඟහරුවාදා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්),
4. රු. 24,615 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඩී.එෆ්.සී.සී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංක : 011-2442442.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
උපදේශක තක්සේරුකරුවෝ සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24,
ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmanKandy@sltnet.lk

*නගර කාර්යාලය :*
අංක 290
හැව්ලොක් පාර,
කොළඹ 5
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය: 2588176
ඊමේල් : schokman@samera1892.com

04-151

### මහජන බැංකුව – ජා-ඇල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වැලිවේරිය, ඌරුවල හි පදිංචියට සුදුසු පරිසරයක පිහිටි පර්චස් දහය (10) බැගින් වූ බිම් කොටස් දෙක (02) ක් මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2007.04.27 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2003.12.05 දින ද, ඩේලිනිව්ස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත් වල 2005.05.19 දින ද, පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– කොළඹ - නුවර පාරේ බැලුම්මහරින් දෙල්ගොඩ හරහා ඇති නව නුවර පාර් බැලුම්මහර හන්දියේ සිට කි. මී. 1ක් පමණ ගියවිට හමුවන රතුපස්වල හන්දියෙන් වමට ඇති හේනෙගම දක්වා යන බස් මාර්ගයේ ඌරුවල පන්සල ළඟ සිට මීටර් 500ක් පමණ යන විට දකුණට ඇති ගුරු පාරේ යාර 25ක් පමණ යනවිට එම පාරට මායිම්ව වම්පසින් පිහිටා ඇත. (කැව්ලියන් බේකරිය ඉදිරිපිට ඇති තට්ටු දෙකේ නිවසට යාබදව පිහිටා ඇත. )

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිළෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත, මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, බටහිර කලාප **III** කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 033-2222325, 033-2226741
ෆැක්ස් අංකය : 033-2226165.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ
ප්‍රසිද්ධ, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපල ඒජන්තවරු.

| *ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය* : | *නව නාගරික කාර්යාලය සහ* වෙන්දේසි ශාලාව : |
|---|---|
| අංක 24, | අංක 290, හැව්ලොක් පාර, |
| ටොරින්ටන් පාර, | කොළඹ 5 |
| මහනුවර. | |
| දුරකථන අංකය : 081-2227593, 081-2224371 | දුරකථන අංක : 011-2502680, 2585408 |
| ෆැක්ස් අංකය : 081-2224371 | ෆැක්ස් අංකය: 2588176 |
| ඊමේල් : schokmanKandy@ sltnet.lk | ඊමේල් : schokman@samera 1892.com |

04-149

### මහජන බැංකුව - මූලස්ථාන ශාඛාව - පිළියන්දල

1986 අංක 32 දරන පනතින් සංශෝධන 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, නාම්පමුණුව පිහිටියා නුගගහලන්ද යැයි කියනු ලබන වටිනා ඉඩම, ඉඩමේ ප්‍රමාණය (ලොට් 2 සී අ 0., රු. 3, පර් 35), (ලොට් 2 ඩී අ0, රු 1, පර් 35) මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.04.25 දින පෙ. ව. 11.30ට එකී ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.11.16 වන දින ඩේලි, නිවුස් දිනමිණ සහ තිනකරන් පුවත් පත්ද 2006.12.01 *ගැසට් නිවේදනය* ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.*– පිළියන්දල සිට මහරගම පාරේ කිලෝ මීටර් 2ක් පමණ ගිය විට දොලේ කනත්ත හංදිය හමුවේ එතැනින් දකුණට ඇති කොට්ටාව පාරේ මීටර් 400ක් පමණ ගියවිට වම් පැත්තට මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* – වෙන්දේසිය අවසාන වූ විගස ගැනුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැනුම් මුදලින් 10% ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2% ද,
4. ලිපිකරු සහ නිවේදිකගේ ගාස්තු වශයෙන් රු. 850 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මහජන බැංකුව බටහිර කලාප 01- කාර්යාලය අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01, සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක: 2393678, 2327848, 2344982, 2344983, 2344985.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුලු දිවයිනටම)
උසාවි කොමසාරිස්
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංක : 2863121

04-99

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

### දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* - (වාර්ෂික)

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ඡේදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ඡේදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | | මිළ ගාස්තුව රු. | ශ. | තැපැල් (මෙරට) රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) | I වන කොටස | 31 | 0 | 5 | 0 |
| | II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) | I වන ඡේදය | 10 | 0 | 5 | 0 |
| | II වන ඡේදය | 12 | 0 | 5 | 0 |
| | III වන ඡේදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01 ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.-* මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළකිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| අප්‍රේල් | 2007.04.05 | බ්‍රහස්පතින්දා | 2007.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.04.12 | බ්‍රහස්පතින්දා | 2007.03.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.04.20 | සිකුරාදා | 2007.04.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2007.04.27 | සිකුරාදා | 2007.04.12 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| මැයි | 2007.05.04 | සිකුරාද | 2007.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.11 | සිකුරාද | 2007.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.18 | සිකුරාදා | 2007.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.05.25 | සිකුරාදා | 2007.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2007.06.01 | සිකුරාද | 2007.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.08 | සිකුරාද | 2007.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.15 | සිකුරාදා | 2007.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.22 | සිකුරාදා | 2007.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.06.29 | සිකුරාදා | 2007.06.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.